# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## වංචා වැළැක්වීමේ (සංශෝධන)

**(70 වන අධිකාරය වූ) වංචා වැළැක්වීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2023 දෙසැම්බර් මස 07 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 නොවැම්බර් මස 29 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[222 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතියේ බලපෑම් ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (70 වන අධිකාරය වූ) වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ පැවරුම් ඔප්පු ලියා සහතික කිරීම හා  සම්බන්ධයෙන් වන වංචා වැළැක්වීම සඳහා පහසුකම් සලසන කාර්ය පටිපාටියක් සඳහා විධිවිධාන සැලසීම වේ.

# වංචා වැළැක්වීමේ (සංශෝධන)

එල්.ඩී.–ඕ. 8/2023

**(70 වන අධිකාරය වූ ) වංචා වැළැක්වීමේ ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1\. මේ පනත 2023 අංක  දරන වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

70 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

2\. (70 වන අධිකාරය වූ) වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තිය, (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන් :

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :-

“(2) පැවරුම් ඔප්පුවක් සම්බන්ධයෙන් වන විට දී -

(අ) විකුණුම්කරු සහ ගැණුම්කරු යන දෙදෙනාම විසින් (1) වන උපවගන්තිය මගින් නියමකර ඇති ආකාරයට ඔවුන්ගේ අත්සන් සහ මහපට ඇඟිලි සලකුණු තබනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ගැණුම්කරුට පැමිණ ඔප්පුව හෝ සාධනපත්‍රය ලියා අත්සන් කිරීමට නොහැකිවන අවස්ථාවක දී, ඔහු විසින්, තමා වෙනුවෙන් එම ඔප්පුව හෝ සාධනපත්‍රය අත්සන් කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකුට ලිඛිතව බලය පවරනු ලැබිය යුතු අතර, එකී තැනැත්තා (1) වන උපවගන්තියේ දක්වා ඇති නියමවලට අනුකූල විය යුතු ය:

එසේ ම තවදුරටත්, ගැණුම්කරු සංස්ථාපිත මණ්ඩලයක් වන විට දී සහ එකී සංස්ථාපිත මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පැමිණ ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් කිරීමට නොහැකි

වන විට දී, එකී මණ්ඩලය, තමා වෙනුවෙන් එම ඔප්පුවට හෝ සාධන පත්‍රයට අත්සන් තැබීමට වෙනත් යම් තැනැත්තකුට බලය පවරනු ලැබිය හැකි අතර, බලය පවරනු ලැබූ එකී තැනැත්තා (1) වන උපවගන්තියේ දක්වා ඇති නියමවලට අනුකූල විය යුතු ය.

(ආ) ගැණුම්කරු බාලවයස්කරුවකු වේ නම්, ගැණුම්කරුගේ භාරකරු මේ පනතේ කාර්යය සඳහා ගැණුම්කරු වෙනුවෙන් ක්‍රියා කිරීමට ශක්නුතාව ඇති තැනැත්තකු විය යුතු ය.”

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී